සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# දෙවන වාර පරීක්ෂණය 2019
# පුරවැසි අධ්‍යාපනය

07 ශ්‍රේණිය | කාලය පැය 02 යි.

නම/ විභාග අංකයඃ

## I - කොටස

- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමිවේ.**
- **ප්‍රශ්න අංක 01- 05 දක්වා ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන් පුරවන්න.**

01. දරුවන්ට දෙමව්පියන්ගේ මෙන්ම සෙසු සාමාජිකයන්ගේ ආදරය .......................................... හා සෙනෙහස ලැබීම විස්තෘත පවුලක විශේෂත්වයයි. (ආලෝකය / උදව් උපකාර / ආරක්ෂාව)

02. සිරිත් විරිත් හා ..................................... ගරු කිරීමට හුරුවීම පවුලේ සාමාජිකයෙකු නිසා ලැබෙන ප්‍රයෝජනයකි. (පාරම්පරිකව / අන්‍ය අදහස් / සම්ප්‍රදායන්)

03. ඔබේ හැකියාවන්ට හා .............................................. වඩාත් ගැළපෙන ක්ෂේත්‍ර තෝරා ගැනීම හා ඊට අදාළ නිපුණතා සංවර්ධනය කර ගැනිම ද වැදගත් ය. (මනසට / දක්ෂතාවන්ට / අපේක්ෂාවන්ට)

04 ඔබ සතුවන උසස් ගුණාංග පිළිබඳ ........................................... තුළින් ආත්මාභිමානය ඇති කර ගත හැකිය. (හැසිරීම් රටාව / ස්වයං ඇගයීම / දූනසිටීම)

05 කෙනෙකු ................................................ පමණක් සැමවිටම ක්‍රියාත්මක කිරීමට උත්සාහ කිරීම දුර්වල ගති ලක්ෂණයකි. (අන් අයගේ / තම මතය / තම සිතුවිලි)

- **අංක 06 - 10 දක්වා ප්‍රශ්නවල දක්වෙන ප්‍රකාශ නිවැරදි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද වරහන් තුළ යොදන්න.**

06 ලෝකයේ කිසිම පුද්ගලයකු තවත් පුද්ගලයකු හා කිසිම ආකාරයකින් සමාන නොවේ. ( )

07 එදිනෙදා ජීවිතයේ දී සමාජය තුළ දක්නට ලැබෙන අනුචිත දේ නිවැරදිව හඳුනාගෙන ඒවාට අනුගතවීම කෙරෙහි ඔබේ අවධානය යොමුකළ යුතුය. ( )

08 සියලු මාධ්‍ය වැඩසටහන් ඔබේ ජීවිත සාර්ථකත්වයට හිතකරය. ( )

09 ආදර්ශවත් චරිතාපදාන කියවීම තුළින් ජීවිතයට වැදගත් වන ආදර්ශ ලබාගත හැකිවේ. ( )

10 සමාජයේ අයහපතට හේතුවන බලවේග හඳුනාගෙන ඒවායින් ඉවත්වීමට ක්‍රියාකිරීම අපේ ජීවිත සාර්ථකත්වයට ඉතා වැදගත් ය. ( )

- **අංක 11 - 15 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර දී ඇති පිළිතුරු අතරින් තෝරා යටින් ඉරක් අඳින්න.**

11 පුද්ගලයකු තුළ ඇතිවන ක්ෂණික කෝපය තුළින් ඔහුට ඇතිවන වඩාත් අහිතකර බලපෑම මින් කුමක් ද?

(1) පළිගැනීමේ චේතනාව ඇතිවීම.

(2) චිත්තවේග පාලනය කර ගැනීමට නොහැකි වීම.

(3) දැඩි ලෙස පීඩාවට පත්වීම.

(4) අපේක්ෂාවන් සුන්වීම.

12 අයහපත් චිත්තවේග තත්වයන් පාලනය සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාකාරකම් අඩංගු පිළිතුර තෝරන්න.

(1) ක්‍රීඩාවල නිරතවීම, කෑ ගැසීම, ආහාර ගැනීම

(2) පැණිරස ආහාර බහුලව ගැනීම, ඇවිදීම, ගීත ගායනය

(3) ගුවන්විදුලියට සවන්දීම, ඇවිදීම, ක්‍රීඩාවල නිරතවීම.

(4) ශබ්ද නඟා හැඬීම, කවි ගායනය, රූපවාහිනී වැඩසටහන් නැරඹීම

13 බුද්ධිමත් පාරිභෝගිකයෙකු ලෙස කටයුතු කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු අඩංගු නිවැරදි පිළිතුර තෝරන්න.

(1) මිල ගණන් සැසඳීම, ගුණාත්මක බව, මිල පාලන ප්‍රතිපත්ති

(2) පාරිභෝගික මිල දර්ශනය, ආදේශක භාණ්ඩ, ශුද්ධ බර

(3) ඇසුරුම් පැවතීම, සිල්ලර මිල, පාලන මිල

(4) මිල පාලන ප්‍රතිපත්ති, මිල දර්ශනය, ආදේශක භාණ්ඩ

14 සමාජ අවශ්‍යතා ඉටුකිරීම සඳහා ශ්‍රමය කැපකරන ස්වයං රැකියාවල යෙදෙන පිරිස පිළිබඳ නිවැරදි ප්‍රකාශය මින් කුමක් ද?

(1) ශ්‍රමිකයන්ට ගෙවීම් ලබයි. (2) මාසිකව වැටුප් ලබන පිරිසකි.

(3) සේවා සැපයීම් පමණක් සිදුකරයි. (4) විවිධ අංශවල ව්‍යාප්තව ඇත.

15 ඔබ විසින් ඉටුකළයුතු යුතුකමක් අඩංගු වන්නේ මින් කවර පිළිතුරේ ද?

(1) දෙමව්පිය ආදරය ලැබීම. (2) ප්‍රීතිමත් පවුල් පරිසරයක ජීවත් වීම.

(3) වැඩිහිටියන්ට ගරු කිරීම. (4) සෞඛ්‍ය පහසුකම් ලබාගැනීම.

- **අංක 16 - 20 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර හිස්තැනෙහි සඳහන් කරන්න.**

16 සාකච්ඡා මගින් ............................................... යහපත් පුරවැසියකු සතු ගුණාංගයකි.

17 ඔබේ මවගේ අක්කාගේ සැමියා ................................................................ වේ.

18 යහගුණ කියාදෙමින් .................................................. පෞරුෂයක් ගොඩනැගීමට ගුරුවරුන් බෙහෙවින් උදව් වේ.

19 ජන සමාජය තුළ පවත්නා සමිති අතර ...................................................... ගමේ පොදු සේවා සැපයීමට මෙන්ම සුබ සාධන කටයුතුවලට සහාය වේ.

20 ජනතාවට අවශ්‍ය තොරතුරු මාධ්‍ය මගින් ඉදිරිපත් කරන අතර ඒවා භාවිතයේ දී ........................................... කටයුතු කිරීම වැදගත් ය.

(ලකුණු 2 x 20 = 40)

## II - කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමු ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න 04 ක් තෝරාගෙන ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.**

01 (1) ඔබට පවුලේ සාමාජිකයෙක් ලෙස ජීවත්වීම නිසා අත්වන ප්‍රයෝජන ඇසුරින් පහත දැක්වෙන සටහන සම්පූර්ණ කරන්න.




(ල. 04)

(2) පාසල් සිසුවකු වශයෙන් පහත සඳහන් අරමුණු ජය ගැනීම සඳහා අනුගමනය කළයුතු ක්‍රියාපටිපාටි එක බැගින් ලියන්න.

A චිත්‍ර නිර්මාණ කුසලතා වර්ධනය කර ගැනීම.

B පාසලේ පරිසර හට කණ්ඩායමට ඇතුළත් වීම.

C හොඳ පන්ති නායකයකු වීම.

D ගණිතය විෂයට ලකුණු 90 ට වඩා ලබාගැනීම. (ල. 04)

(3) පවුලේ සාමාජිකයෙකු ලෙස වර්ධනය කරගත යුතු යහපත් ගුණාංග කිහිපයක් පහත දක්වා ඇත. එම ගුණාංග පෙන්විය හැකි අවස්ථාවක් බැගින් ලියා දක්වන්න.

A සුහදශීලී බව -

B අන්‍ය මත ගරු කිරීම -

C නායකත්වයට ගරු කිරීම -

D අවංක බව - (ල. 04)

(4) ශ්‍රී ලංකාවේ ආදර්ශවත් පුද්ගලයින්ගේ නම් පහත දක්වා ඇත. ඔවුන්ගෙන් ඔබට ගතහැකි ආදර්ශ එක බැගින් ලියන්න.

A සුසන්තිකා ජයසිංහ මිය -

B මාර්ටින් වික්‍රමසිංහ මහතා -

C වික්ටර් රත්නායක මහතා -

D ආතර් සී. ක්ලාක් මහතා - (ල. 04)

02 (1) පුද්ගලයෙකුගේ පිරිහීම කෙරෙහි බලපාන සාධක 3 ක් ලියා දක්වන්න. (ල. 03)

(2) පහත වගුව සම්පූර්ණ කරන්න.

| විවේකය ගත කිරීම සඳහා ඔබට යෙදිය හැකි සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම් | එම ක්‍රියාකාරකම්වල යෙදීම නිසා අත්වන ප්‍රයෝජන |
|---|---|
| 1. | 1. |
| 2. | 2. |
| 3. | 3. |
| 4. | 4. |
| 5. | 5. |

(ල. 05)

(3) පුද්ගල ජීවිත සාර්ථකත්වයට බලපාන හිතකර බලවේග තුනක් නම් කරන්න. (ල. 03)

03 (1) පවුලේ සාමාජිකයින් විසින් අනුගමනය කරනු ලබන සිරිත් විරිත් සම්ප්‍රදායන් කීපයක් පහත දැක්වේ. ඒවා වෙන්කර දක්වන්න.

(නව නිවසකට මුල්ගල තැබීම, දිනපතා ආගම සිහිකිරීම, පවුලේ සාමාජිකයින් එක්ව ආහාර ගැනීම, ඉඳුල් කටගෑම, දරුවන්ට අකුරු කියවීම, වැදගත් ආගමික දිනවල පවුලේ සැම එක්ව ආගමික ස්ථානවලට යාම, විවාහ මංගල උත්සව, පාසල් යාමට පෙර දෙමාපියන්ට වැඳීම)

| A සිරිත් විරිත් | B සම්ප්‍රදායන් |
|---|---|
| 1. | 1. |
| 2. | 2. |
| 3. | 3. |
| 4. | 4. |

(ල. 04)

(2) යහපත් පුරවැසියකු සතු විය යුතු ගුණාංග 4 ක් සඳහන් කරන්න. (ල. 04)

(3) අසල්වැසියන් සමග සුහදව කටයුතු කිරීම නිසා ඔබට ලැබෙන වාසි 3 ක් ලියන්න. (ල. 03)

04 (1) ජන සමාජයක පවතින අන්තර් සබඳතා පිළිබඳව තොරතුරු කිහිපයක් පහත දක්වා ඇත. ඒවා සුදුසු පරිදි සම්බන්ධකර නැවත ලියන්න.

- දෙමාපිය දූ දරු සම්බන්ධතා
- ගුරුවරුන් හා සිසුන් අතර අන්තර් සම්බන්ධතා
- අසල්වැසියන් සමග අන්තර් සබඳතා පැවැත්වීම

A හැකියා හා දක්ෂතා ඔපමට්ටම් කිරීම.

B සහයෝගයෙන් කටයුතු කිරීම.

C පෝෂණය කිරීම

D සමබර පෞරුෂයක් ගොඩනැගීම.

E අවනත වීම.

F එකිනෙකාට උදවු කිරීම. (ල. 06)

(2) පහත ආයතන මගින් සිදුකෙරෙන කාර්යයන් එක බැගින් ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.

A ආගමික සංවිධාන -

B වෘත්තීය සමිති -

C මරණාධාර සමිති -

D යෞවන සමිති -

E ක්‍රීඩා සමිති - (ල. 05)

05 (1) ජනතාවට අවශ්‍ය තොරතුරු මාධ්‍ය මගින් විවිධාකාරව ඉදිරිපත් කරයි. පහත දැක්වෙන කටයුතු සඳහා මාධ්‍ය මගින් අප අවධානය යොමු කළ යුතු තොරතුර කුමක්දැයි දක්වන්න.

i. හෙට දිනයේ වර්ෂාපතනය -

ii. ඇමෙරිකානු ඩොලරයක වටිනාකම රුපියල් -

iii. ඉඩමක් මිලදී ගැනීම -

iv. රාජ්‍ය සේවයේ පුරප්පාඩු -

v. නීති විරෝධී කටයුත්තක් පිළිබඳව පැමිණිලි කිරීම - (ල. 05)

(2) පහත දැක්වෙන්නේ අභියෝගයකට සාර්ථකව මුහුණදීමේ පියවර කීපයකි. එහි හිස් කොටු සම්පූර්ණ කරන්න.

(විකල්ප විසඳුම් / සිත ධෛර්යමත් කර ගැනීම / අභියෝග ජය ගැනීම) (ල. 03)




(3) පහත සඳහන් අවස්ථා සඳහා ඔබ මුහුණ දෙන ආකාර එක බැගින් දක්වන්න.

A විෂය තෝරාගැනීම

B සමීපතම පවුලේ සාමාජිකයකු මියයාම

C නොගැලපෙන මිතුරකු හමුවීම (ල. 03)

06 (1) පහත උපකාරක පද යොදා ගනිමින් ප්‍රහේලිකාව සම්පූර්ණ කරන්න.




<u>හරහට</u>

(1) රාජ්‍ය සේවකයින්ට වයස සම්පූර්ණ වූ විට හිමිවේ.

(3) සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම් තුළින් සමනය වේ.

(5) ඇඳුම් සමග යෙදේ.

(6) ජීවිත අත්දැකීම් බවට පත්තර ගත යුතුය.

<u>පහළට</u>

(1) කාර්යබහුලත්යෙන් පසු පුද්ගල ජීවිතයට අත්‍යවශ්‍ය වේ.

(2) ක්‍රීඩකයෝ මෙය ලබාගැනීමට උත්සාහ කරයි.

(3) ඇතැම්විට පාරිභෝගිකයින් මුලාකරයි.

(4) ශ්‍රමයට හිමිවේ. (ල. 08)

(2) අධ්‍යාපනය හැදෑරීමේ දී ඔබට මුහුණදීමට සිදුවන අභියෝග 3 ක් සඳහන් කරන්න. (ල. 03)

07 (1) ඔබට හිමි අයිතිවාසිකම් අනුව පහත දැක්වෙන සටහන සම්පූර්ණ කරන්න.

අයිතිවාසිකම්

සිවිල් අයිතිවාසිකම් | දේශපාලන අයිතිවාසිකම්

සිවිල් අයිතිවාසිකම් → ජීවත්වීමේ අයිතිය → 1. ............................................ → 2. ............................................ → අදහස් ප්‍රකාශ කිරීම → 3. ............................................

දේශපාලන අයිතිවාසිකම් → ඡන්දය ප්‍රකාශ කිරීම → 4. ............................................ → රජයේ තනතුරු දැරීම → 5. ............................................ → 6. ............................................

(ල. 06)

(2) ඔබ ඉහත දැක්වූ අයිතිවාසිකම් සඳහා ඉටුකළයුතු යුතුකම් දක්වන්න. (ල. 05)

## I කොටස

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 01. | ආරක්ෂාව | 02. | සම්ප්‍රදායන් | 03. | දක්ෂතාවන්ට | 04. | ස්වයං ඇගයීම | | | | | | |
| 05. | තම මතය | 06. | ✓ | 07. | × | 08. | × | 09. | ✓ | 10. | ✓ | 11. 2 | 12. 3 |
| 13. | 1 | 14. | 4 | 15. | 3 | 16. | තීරණවලට එළඹීම | 17. | ලොකු තාත්තා / මහප්පා | | | | |
| 18. | සමබර | 19. | ග්‍රාම සංවර්ධන සමිති | 20. | විචාරශීලීව | | | | | | | | |

(2 x 20 = 40)

## II කොටස

01. (1) පිටුව 06 (සුදුසු පරිදි ලකුණු ලබාදෙන්න.) (ල. 04)
(2) සුදුසු පරිදි ලකුණු ලබාදෙන්න. (ල. 04)
(3) A ශ්‍රමදානය, අවුරුදු උළෙල, ක්‍රිකට් ගැසීම B සාකච්ඡා, ක්‍රීඩා කිරීම, විවාහ උළෙල
C තීරණ පිළිගැනීම, උපදෙස් ලබාගැනීම D මුදල් භාවිතය, බඩුබාහිරාදිය බෙදාගැනීම... ආදිය
(සුදුසු පරිදි ලකුණු ලබාදෙන්න.) (ල. 04)
(4) A ක්‍රීඩාවෙන් ඉහළට යාම, අභියෝග ජය ගැනීම ආදිය
B ලේඛණයෙන් ඉහළට යාම, අභියෝග ජය ගැනීම
C ගායනයෙන් ඉහළට යාම ආදිය
D නව සොයාගැනීම්, ලොව ගවේෂනය, නව විද්‍යාත්මක හේතු
(සුදුසු පරිදි ලකුණු ලබාදෙන්න.) (ල. 04)

02 (1) මත්ද්‍රව්‍ය භාවිතය, නුසුදුසු පොත්පත්, වීඩියෝ දර්ශන ආදිය නැරඹීම, නරක මිතුරු ඇසුර ආදිය (ල. 03)
(2) චිත්‍ර ඇඳීම, කවි ගී ගායනය, කවි ගී නිර්මාණය, නාට්‍ය රචනා කිරීම, සංගීත භාණ්ඩ වාදනය, නර්තනය, පරිසර අලංකරණය ආදිය (ප්‍රයෝජන සඳහා ද සුදුසු පරිදි ලකුණු ලබාදෙන්න.) (ල. 05)
(3) කළණ මිතුරන්, ආගමික ආයතන, යහපත් පොත්පත්, යහපත් මාධ්‍ය වැඩසටහන් (ල. 03)

03 (1)

| සිරිත් විරිත් | සම්ප්‍රදායන් |
|---|---|
| නව නිවසකට මුල්ගල තැබීම | පවුලේ සාමාජිකයින් එක්ව ආහාර ගැනීම |
| දරුවන්ට අකුරු කියවීම | දෙමාපියන්ට වැඳීම |
| ඉඳුල් කටගෑම | දිනපතා ආගම සිහිකිරීම |
| විවාහ මංගල උත්සව | වැදගත් ආගමික දිනවල පවුලේ සැම එක්ව ආගමික ස්ථානවලට යාම (ල. 03) |

(2) ස්වයං විනයෙන් යුතුව කටයුතු කිරීම / නායකත්වය දැරීම / නායකත්වයට ගරු කිරීම / අවංක බව / ඉවසීම / අන්‍ය මත ගරු කිරීම ආදී කරුණු (පෙළ පොත 38 පිටුව) (ල. 04)
(3) ශ්‍රමදාන කටයුතුවලදී, පොදු ආගමික උත්සව වලදී, උළු සෙවිලි කිරීම වැනි අවස්ථාවලදී ආදී කරුණු (පිටුව 44) (ල. 03)

04 (1) i. C, E ii. A, D iii. B, F (ල. 06)
(2) A ආගමික සංවිධාන - යහපත් අරමුණු සඳහා පුද්ගලයින් යොමුකිරීම.
B වෘත්තීය සමිති - වෘත්තීය ඉල්ලීම් සඳහා මැදිහත් වීම.
C මරණාධාර සමිති - මරණාධාර හා උදව් උපකාර ලබාදීම
D යෞවන සමිති - සාමූහික බව, එකමුතු බව, නායකත්වයට ගරු කිරීම, තරුණ පිරිස යහපතෙහි යෙදවීම, නව අදහස් හුවමාරු කර ගැනීම
E ක්‍රීඩා සමිති - සාමූහිකත්වය, උද්යෝගිමත් පිරිසක් ගොඩනැගීම, නායකත්වයට ගරු කිරීම
(ආදී ලෙස සුදුසු පරිදි ලකුණු ලබාදෙන්න.) (ල. 05)

05 (1) i. කාලගුණික අනාවැකි ii. විනිමය අනුපාත iii. වෙළෙඳ දැන්වීම්
iv. රැකියා තොරතුරු v. හදිසි හා වැදගත් දුරකථ අංක (පිටුව 56) (ල. 05)
(2) B සිත ධෛර්යමත් කර ගැනීම A විකල්ප විසඳුම C අභියෝ ජයගැනීම (ල. 03)
(3) A දක්ෂතාව / රුචිකත්වය / හැකියාව අනුව තෝරාගැනීම
B අන් අයව සනසමින් ඉවසා දරාසිටීම
C ක්‍රමයෙන් ඔහුගෙන් ඈත්වීම, වඩාත් සමීප නොවීම (සුදුසු පරිදි ලකුණු ලබාදෙන්න.) (ල. 03)

06 (1) හරහට
1. විශ්‍රාම 3. වෙහෙස 5. පැළඳුම් 6. පරාජයන්
පහළට
1. විවේකය 2. ජය 3. වෙළෙඳුන් 4. වැටුප (ල. 08)
(2) තරගකාරීත්වයට මුහුණදීම සමාජය සංකීර්ණ වීම / මාධ්‍ය බලපෑම් / නූතන විලාසිතා / සංස්කෘතික පරිහානිය ආදී කරුණු (පිටුව 68 - 69) (ල. 03)

07 (1) පිටු අංක 60 (ල. 06)
(2) පිටු අංක 61 (දී ඇති පිළිතුරුවලට අනුව යුතුකම් සඳහන් කොට ඇත්නම් ලකුණු ලබාදෙන්න.) (ල. 05)